WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,585 — 1958 නොවැම්බර් 14 වැනි සිකුරාද — 14.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝග මවිසින් පිළිගනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියේ 7 වැනි අතුරු වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

1958 නොවැම්බර් මස 11 දින,
කොළඹ දීය.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම සහ ආහාර ඇමති.

උපලේඛනය

| දිනය | නියෝගය දුන් බලධාරියා | නියෝගය බලපවත්වන ද්‍රව්‍ය | නියෝගය පලකළ ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 58.10.15 | ... මිළ (ආහාර) පාලක ... ... ... | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | 1958.10.15 දින අංක 11.553 |
| 58.10.8 | ... එම ... ... ... | කිරි ආහාර (වාර්තා) ... | 1958.10.9 දින, අංක 11,548 |
| 58.10.10 | ... පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කයන්හි සහකාර මිළ (ආහාර) පාලක ... | කරවල සහ වියළි ඉස්සෝ | 1958.10.14 දින අංක 11,552 |

# මිල පාලන දැන්වීම්

**නො. වී. 53 දරණ ආහාර මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය.**

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

**නියෝගය**

වවුනියා දිස්ත්‍රික්කයේ උප ආහාර මිළ පාලක තැන්පත් පරරාජසේකරම් පිල්ලෙ තම්බයියා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මාවෙත පැවරී ඇති බලතල අනුව :—

(1) 1958 අගෝස්තු මස 29 වෙනි දින අංක 11,508 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1958 අගෝස්තු මස 25 වෙනි දින නො. 50 දරණ ආහාර මිළ නියෝගයේ පළමු වෙනි උප ලේඛනයෙහි සඳහන් වියලි මිරිස් පිළිබඳව එම උප ලේඛනයෙහි පළමුවෙනි තීරයෙහි සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිලද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිලද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක් ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද මීට යාකර ඇති 2 වැනි උප ලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ ගණන් මේ දැන් පටන් මේ උප ලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් මිරිස් පිළිබඳව 1958 අගෝස්තු මස 29 වෙනි දින අංක 11,508 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධව 1958 අගෝස්තු 25 දින නො. 50 දරණ ආහාර මිළ නියෝගයේ 3 සිට 9 දක්වා ඡේදයන් මෙම නියෝගයෙන්හිම අන්තර්ගතවූ හැටියට සැලකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

පී. තම්බයියා,
උප ආහාර මිළ පාලක, වවුනියා දිස්ත්‍රික්කය.

1958 නොවැම්බර් මස 8 වැනි දින පෙ. ව. 10 ට වවුනියාවේ කච්චේරියේදී අත්සන් තබන ලදී.

3419—ජේ. ඇන්. බී 8675—4,877 (11/58)

## පළමුවෙනි උප ලේඛනය

| | හො. තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | රා. සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| වවුනියාවේ දෙමළ ආදයම් පාළක නිළධාරි තැනගේ කොට්ඨාශයේ ආසිකුලම වවුනියාව, නොච්චිමොදයි, නෙදුම්කුලම්,පුදුකුලම් | | |
| වවුනියා සිංහල ආදයම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයේ මඩුකන්ද සහ ඊරට්පෙරියකුලම | | |

**පළමුවෙනි තීරය**

විස්තර

| | | | |
|---|---|---|---|
| 1. | වියළි මිරිස් … … … … | 88 27 … | 0 90 |

## දෙවැනි උප ලේඛනය

| | 1 වැනි තීරය<br>කොට්ඨාශය | 2 වැනි තීරය<br>හො. තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට දෙවැනි උප ලේඛනයේ සඳහන් ගණන් වලට පහත සඳහන් මිළ ගණන් එකතු විය යුතුයි | 3 වැනි තීරය<br>රා. සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට දෙවැනි උප ලේඛනයේ සඳහන් ගණන් වලට පහත සඳහන් මිළ ගණන් එකතු විය යුතුයි |
|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. |
| 1. | ආදයම් පාලක දිස්ත්‍රික්කය දෙමළ මරුදන්කුලම් මරදමඩු, රාසේද්‍රකුලම් ආදයම් පාලක දිස්ත්‍රික්කය සිංහල මරදමඩුව හැර සුදුවැන්දපුලවු සහ උළුකුලම … … | 0 25 … | 0 01 |
| 2. | ආදයම් පාලක දිස්ත්‍රික්කය දෙමළ පෙරියපුලියන්කුලම වාකයිකුඩ්ඩිනා ඕලුකුලම් වලයි වෛකාලකුලම් සහ සිංහල ආදයම් පාලක දිස්ත්‍රික්කයේ උළුකුලම කොට්ඨාශයේ මරදමඩුව … … … … … | 0 50 … | 0 01 |
| 3. | වවුනියා උතුර ආදයම් පාලක දිස්ත්‍රික්කයේ නෙඩුන්කර්නි මාන්කුලම්, ඕලුමඩු කනගරායන්කුලම් සහ පුඩියන්කුලම් … … … … | 0 50 … | 0 01 |
| 4. | වවුනියාවේ උතුරු ආදයම් පාලක දිස්ත්‍රික්කයේ පරන්තන් මනවාලන් පට්ටමුරිප්පු කන්ඩුවාන්, කජලාමඩු, කච්චල්කොඩි … … … … | 0 75 … | 0 02 |
| 5. | වවුනියාවේ මුහුදුබඩ ප්‍රදේශයේ ආදයම්පාලක දිස්ත්‍රික්කයේ මුල්ලිය වලෙයි, තන්නියුත්තු, මුලතිවු, වල්ලාමුල්ලිවයිකාල් … … … … | 1 0 … | 0 02 |
| 6. | මුහුදුබඩ ප්‍රදේශයේ ආදයම් පාලක දිස්ත්‍රික්කයේ කුමුලමුනෙයි පුදුකුඩියිරිප්පු, අම්බලවන් පොයිකාල් … … … … … | 1 25 … | 0 02 |
| 7. | මුහුදුබඩ ප්‍රදේශයේ ආදයම් පාලක දිස්ත්‍රික්කයේ කෝකිලායි සහ කොක්තුඩුවායි … | 1 50 … | 0 03 |

---

**බීඩී/43 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය.**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

බදුලු දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් තුවන් ඉසකීන් කාසීම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3(2) දරණ වගන්තිය සමග කියවියයුතු අංක 4 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

1. 1958 අගෝස්තු 27 වැනි දින අංක 11,505 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පල කරන ලද 1958 අගෝස්තු 22 වැනි දින බීඩී/41 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් අර්තාපල් පිළිබඳව එම උපලේඛනයෙහි 3 වැනි හා 4 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළෙඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළෙඳ මිළද, මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

2. මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය, තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වන සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ, මේ දුන් පටන්, උපලේඛනයේ 3 වැනි හා 4 වැනි තීරවල අනු පිළිවෙලින් සඳහන්කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

3. තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

   (අ) උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

   (ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයක් පරිභෝගය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනුලබන බවත්,

   මෙම නියෝගයෙන් නියම කරමි.

4. එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනුලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකුවිසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

5. තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

6. එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා.'' යන්නෙන් සළකනුලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

7. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය බර අනුවයි ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ;

(ඉ) විකුණූ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය, ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බව නියම කරමි.

8. උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය ඔතා හෝ බහා දෙන යම්කිසිදෙයක් වෙතොත් එහි මිළත්, උපලේඛනයේ 3 වැනි 4 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බව ද නියම කරමි.

9. ඕලන්දයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වනලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහයක් අඩු කොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

10. චීනයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වනලද අර්තාපල් විකුණන විට දළබරින් තාරබර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහතුනක් අඩු කොට ඉතිරිබර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

11. ජපානයෙන් ලෑලිපෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණනවිට දළබරින් තාරබර වශයෙන් පෙට්ටියකට රාත්තල් විසිපහක් අඩු කොට ඉතිරිබර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

12. ලෑලි පෙට්ටිවල හැර වෙන යම් කිසිවක බහා අර්තාපල් විකුණන විට අර්තාපල් බහා ඇති එම එක එක භාණ්ඩය සඳහා රාත්තල් තුනබැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

13, මෙම නියෝගය සඳහා ''ශුද්ධ'' යන්නෙන් හැඟවෙන්නේ දළබරින් තාරබර අඩු කොට ඉතිරිවන බර හෝ අර්තාපල් වල පමණක් බර බවද නියම කරමි.

1958 නොවැම්බර් මස 8 වැනි දින පෙ.ව. 9.30ට බදුලු කච්චේරියේදී අත්සන් කරනලදී,

ඊ. අයි. කාසිම්,
බදුලු දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන.

## උප ලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| සීමාවන් | විස්තර | තොග වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන් දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | | රු. ශ. | රු. ශ. |
| බදුල්ල නගර සභාව, බෝගොඩ ගම් කායෳී සභා සීමාව තුළ පිහිටි හාලි ඇල ටවුම, බල්ලාකැටුව සහ දෙමෝදර ටවුම, කුඹල්වෙල ගම් කායෳී සභා සීමාව තුළ පිහිටි නමුනුකුලටවුම, ඇල්ල ටවුම ... ... ... | අර්තාපල් ... | 31 00 ... | 0 32 |
| පස්සර සුලුනගර සභාව, හාලිඇල ටවුම හැර බෝගොඩ ගම් කායෳී සභා සීමාව, ඇල්ල ටවුම, බල්ලාකැටුව, දෙමෝදර සහ නමුණුකුල ටවුම හැර කුඹල් වෙල ගම් කායෳී සභා සීමාව, රිල්පොල සහ සොරණාතොට ගම් කායෳී සභා සීමාවන් ... ... ... ... ... | අර්තාපල් ... | 31 0 ... | 0 33 |
| ලුනුගල සුලු නගර සභා සීමාව, පස්සර ගම් කායෳී සභා සීමාව ... ... | අර්තාපල් ... | 31 0 ... | 0 33 |
| බින්තැන්න, කඳුකර, ඔයපලාත, වියළුව සහ පට්ටිපොල සහ වෑගම්පත්තු නිල්ගල ගම් කායෳී සභා සීමාවන් ... ... ... ... | අර්තාපල් ... | 31 0 ... | 0 33 |
| පැල්වත්ත, අරලුපිටිය, බුත්තල, මැදගම් පත්තු, මුප්පනේ ටවුමේ පිහිටි මොනරාගල කඩමණ්ඩිය හැර බුත්තල වැදිරට' දඹගල්ල, නිකවැරටිය, මහවැදිරට ගම් කායෳී සභා සීමාවන් ... ... ... ... | අර්තාපල් ... | 32 0 ... | 0 34 |
| හපුතලේ නගර සභා සීමාව ... ... ... ... | අර්තාපල් ... | 31 0 ... | 0 33 |
| බණ්ඩාරවෙල නගර සභා සීමාව, දියතලාවේ ග්‍රාමීය කොට්ඨාශය, හල්දූම්මුල්ල ටවුම | අර්තාපල් ... | 31 0 ... | 0 33 |
| කොස්ලන්ද නගර සභා සීමාව ... ... ... ... | අර්තාපල් ... | 31 0 ... | 0 33 |
| බණ්ඩාරවෙල, හපුතලේ සහ දියතලාව හැර මහපලාත ගම්කායෳී සභා සීමාව, වැලිමඩ සුලුනගර සභා සීමාව, වැල්ලවාය ටවුම සහ කන්දපල්ල නො. 1 ගම්කායෳී සභා සීමාව ... ... ... ... | අර්තාපල් ... | 31 0 ... | 0 33 |
| දඹවිනි පළාත, දෙහිවිනි පළාත, මැදපළාත, උඩපළාත, යටිපළාත සහ ගම්පහ ගම් කායෳී සභා සීමාවන් ... ... ... ... | අර්තාපල් ... | 31 0 ... | 0 33 |
| බුත්තල වැදිරට ගම් කායෳී සභා සීමාව තුළ පිහිටි මුප්පනේ ටවුම, මොණරාගල කඩමණ්ඩිය, කන්දපල්ල නො. 2 ගම් කායෳී සභා සීමාව, සීත්තරම්පළාත, කෝන්ගල බින්තැන්න, වැල්ලවාය ටවුම හැර වැල්ලවාය ගම් කායෳී සභා සීමාව ... | අර්තාපල් ... | 31 0 ... | 0 33 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැක.

**බීඩී/44 වැනි අංක දරණ ආහාර මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය—වියලි මිරිස්.**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

බදුලු දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් තුවන් ඉසකින් කාසිම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු අංක 4 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව —

(1) 1958 අගෝස්තු 27 වැනි දින අංක 11,505 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 අගෝස්තු 22 වැනි දින බීඩී/41 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව, එම උප ලේඛනයේ 3 වැනි සහ 4වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද, මෙම නියෝගයෙන් අද දින සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ, මේ දූන් පටන්, මේ උප ලේඛනයේ 3 වැනි සහ 4වැනි තීරවල අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උප ලේඛනයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව 1958 අගෝස්තු 27 වැනි දින අංක 11,505 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1958 අගෝස්තු 22 වැනි දින බීඩී/41 දරණ ආහාර මිළ නියෝගයේ 3 වැනි ඡෙදයේ සිට 4 වැනි ඡෙදය දක්වා ඡෙදයන් මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැළකිය යුතු ලෙස මෙම නියෝගයෙන් නියම කරමි.

1958 නොවැම්බර 8 දින පෙ.ව. 9.30 ට බදුලු කච්චේරියේදී අත්සන් කරන ලදී.

වී. අයි. කාසිම්,
බදුලු දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන.

### උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| සීමාවන් | විස්තර | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | | රු. ශ. | රු. ශ. |
| බදුල්ල නගර සභාව, බෝගොඩ ගම් කාය්‍යී සභා සීමාව තුල පිහිටි හාලි ඇල වවුම, බල්ලාකැටුව සහ දෙමෝදර ටවුම, කුඹුල්වෙල ගම් කාය්‍යී සභා සීමාව තුල පිහිටි නමුණුකුල ටවුම ... ... | වියලි මිරිස් ... | 91 16 ... | 0 89 |
| පස්සර සුලුනගර සභාව, හාලිඇල ටවුම හැර බෝගොඩ ගම් කාය්‍යී සභා සීමාව, ඇල්ල ටවුම හැර කුඹුල්වෙල ගම් කාය්‍යී සභා සීමාව, බල්ලාකැටුව, දෙමෝදර සහ නමුණු කුල ටවුම, රිල්පල සහ සොරනාතොට ගම් කාය්‍යී සභා සීමාවන් ... ... ... | වියලි මිරිස් ... | 91 16 ... | 0 90 |
| ලුනුගල සුලු නගර සභා සීමාව, පස්සර ගම් කාය්‍යී සභා සීමාව ... | වියලි මිරිස් ... | 92 02 ... | 0 91 |
| බින්තැන්න, කඳුකර, ඔයපලාත, වියළුව, පට්ටිපොල සහ වැගම්පත්තු නිල්ගල ගම්කාය්‍යී සභා සීමාවන් ... ... ... | වියලි මිරිස් ... | 92 88 ... | 0 92 |
| පැල්වත්ත, අරලුපිටිය, බුත්තල, මැදගම්පත්තු, මුප්පනේ පිහිටි මොණරාගල ටවුම හැර බුත්තල වැදිරට, දඹගල්ල, නිකවැරටිය මහවැදිරට ගම් කාය්‍යී සභා සීමාවන් ... ... ... | වියලි මිරිස් ... | 93 74 ... | 0 93 |
| හපුතලේ නගර සභා සීමාව ... ... ... | වියලි මිරිස් ... | 91 16 ... | 0 90 |
| බණ්ඩාරවෙල නගර සභා සීමාව, දියතලාවේ ග්‍රාමීය කොට්ඨාශය, හල්දුම් මුල්ල ටවුම ... ... ... ... | වියලි මිරිස් ... | 91 16 ... | 0 90 |
| කොස්ලන්ද නගර සභා සීමාව ... ... ... | වියලි මිරිස් ... | 91 16 ... | 0 91 |
| බණ්ඩාරවෙල, හපුතලේ සහ දියතලාව හැර මහපලාත ගම් කාය්‍යී සභා සීමාව, වැලිමඩ සුළු නගර සභාව, වැල්ලවාය ටවුම සහ කන්දපල්ල නො. 1 ගම් කාය්‍යී සභා සීමාව ... ... ... | වියලි මිරිස් ... | 92 02 ... | 0 91 |
| දඹවිනි පලාත, දෙහිවිනි පලාත, මැද පලාත, උඩපලාත, යටිපලාත සහ ගම්පහ ගම් කාය්‍යී සභා සීමාවන් ... ... ... | වියලි මිරිස් ... | 92 88 ... | 0 92 |
| බුත්තල වැදිරට ගම් කාය්‍යී සභා සීමාව තුල පිහිටි මුප්පනේ මොණරාගල කඩමණ්ඩිය, කන්දපල්ල නො. 2 ගම්කාය්‍යී සභා සීමාව, සිත්තරම්පලාත, කොන්ගල බින්තැන්න, වැල්ලවාය ටවුම හැර වැල්ලවාය ගම් කාය්‍යී සභා සීමාව ... . ... ... ... | වියලි මිරිස් ... | 92 02 ... | 0 92 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත **මිළ** නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය මේ මිළ ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

**ඊ/15/58 වෙනි අංකය දරණ මිල නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය.—වියලි මිරිස්**

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

(ආහාර) නියෝජ්‍ය මිල පාලක තැන්පත් ඇන්ටන් රොක්වෙල් මැක්හෙයිසර් වන මම, 1950හේ අංක 29 දරණ මිල පාලන පණතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958වේ සැප්තැම්බර් 22 වෙනි දින හා අංක 11,529 දරණ ලංකා ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පල කරන ලද 1958වේ සැප්තැම්බර් 17 වෙනි දින හා ඊ/13/58 දරණ ආහාර මිල නියෝගයේ උපලේඛනයේ 1 වෙනි තීරයෙහි සඳහන් වියලි මිරිස් පිළිබඳව, එම උප ලේඛනයෙහි 2, 3 සහ 4 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන්, තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිලද, සිල්ලර වෙළෙන්දකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිලද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් හා සිල්ලර වශයෙන් විකිණීමේදී සුද්ද බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිල පළමුවෙනි උපලේඛනයේ 2, 3 සහ 4 වැනි තීරවල අනුපිළිවෙළින් සඳහන්කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මීට යාකර ඇති පළමුවෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය දෙවැනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ප්‍රදේශයන්හි සිල්ලර වශයෙන් විකිණීමේදී විකිණිය හැකි වැඩිම මිල රාත්තලක්, ත්‍රිකුණාමලයේ පලාත් ආණ්ඩු සභා ප්‍රදේශය තුල විකිණීම සඳහා යොද ඇති පළමුවෙනි උපලේඛනයේ 3 වෙනි තීරයේ සඳහන් මිල දෙවැනි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් මිල සමග වැඩි කිරීමෙන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) මෙම උපලේඛන්යේ පළවෙනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව, 1958වේ සැප්තැම්බර් 22 වෙනි දින අංක 11,529 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958වේ සැප්තැම්බර් 17වන දින, ඊ/13/58 වෙනි ආහාර මිල නියෝගයේ (4) සිට (9) දක්වා ඡෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගත වූ හැටියට සැලකිය යුතු ලෙස ද මෙම නියෝගයෙන් නියම කරමි.

1958වේ නොවැම්බර් මස 11 වැනි දින ආ. හා. 3ට ත්‍රිකුණාමල කච්චේරියේ දී අත්සන් තබන ලදී.

ඇන්ටන් ආර්. මැක්හෙයිසර්,
ත්‍රිකුණාමලයේ (ආහාර) නියෝජ්‍ය මිල පාලක.

### පළමුවෙනි උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය | 4 වෙනි තීරය |
|---|---|---|---|
| විස්තර | ත්‍රිකුණාමල නගරයේ සහ කඩවත් කරවන ආදයම් නිල ධාරි තැනගේ කොට්ඨාශය තුළ හොණ්ඩරයක වැඩිම තොග මිල | ත්‍රිකුණාමලයේ පලාත් ආණ්ඩු සභා කොට්ඨාශය තුළ ශුද්ධ බර රාත්තලක වැඩිම සිල්ලර මිල | කොඩ්ඩියාර් සහ කම්පලගමු පත්තු කරවන නිලධාරින්ගේ කොට්ඨාශය තුළ දළ බර හොණ්ඩරයක වැඩිම තොග මිල |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| වියලි මිරිස් ... ... ... | 88 14 ... | 0 87 ... | 89 54 |

**සැලකිය යුතුයි.**—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිල නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිල ගණන්ය. මේ මිල ගණන් වලට ඉහලින් ඒ ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකියි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.